# <u>බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය</u>

## <u>මාතර නාවිමන සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථාන ව්‍යාපෘතියේ මධ්‍ය කාලීන ඇගයීම සඳහා පූර්ව යෝජනා කැඳවීම 2025</u>

මාතර පිහිටි නාවිමන සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථාන ව්‍යාපෘතියේ මධ්‍ය කාලීන ඇගයීම සිදු කිරීම සඳහා පූර්ව යෝජනා ඉදිරිපත් කරන ලෙස **බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය** සුදුසුකම්ලත් සහ පළපුරුදු **තනි පුද්ගල උපදේශන ප්‍රසම්පාදනය යටතේ** ඇගයුම්කරුවන්ට ආරාධනා කරයි.

**ව්‍යාපෘති පසුබිම**

දකුණු ආසියානු කලාපයේ පොහොසත් සංස්කෘතික උරුමයන් ප්‍රවර්ධනය කිරීම සහ සංරක්ෂණය කිරීමත් සංස්කෘතික කටයුතු තුළින් කලාපීය සහයෝගීතාව ශක්තිමත් කිරීමත් සඳහා 2008 වසරේදී මාතර නාවිමන සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථාන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. 2025 ජූනි මාසය වන විට, මෙහි සිවිල් ඉදිකිරීම් කටයුතුවලින් ආසන්න වශයෙන් 65% ක් අවසන් කර ඇතත්, විවිධ පරිපාලන හා මෙහෙයුම් අභියෝග හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාදයන්ට මුහුණ දී තිබේ.

**ඇගයුම් අරමුණ**

මධ්‍ය කාලීන ඇගයුමෙහි අරමුණු වන්නේ;

- මේ දක්වා ලබා ඇති ප්‍රගතිය සහ ප්‍රතිඵල තක්සේරු කිරීම,
- උගත් පාඩම් හඳුනා ගැනීම,
- ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාම සහ සාර්ථකව නිම කිරීම සඳහා ප්‍රායෝගික නිර්දේශ ලබා දීම.

පහත සඳහන් ප්‍රධාන අංශ කෙරෙහි ඇගයුමෙන් අවධානය යොමු කරනු ලැබේ: අදාළත්වය, ඵලදායීත්වය, කාර්යක්ෂමතාව සහ තිරසරභාවය.

**සම්පූර්ණ ඇගයීම් කාලය සති හතරක් (04) වේ.**

**අවශ්‍ය සුදුසුකම් සහ පලපුරුද්ද**

අයදුම්කරුවන් සතුව:

- රජයේ හෝ පරිත්‍යාගශීලීන්ගේ අරමුදල් මගින් සිදු කරන සංවර්ධන ව්‍යාපෘති සඳහා අධීක්ෂණ සහ ඇගයීම් පැවරුම් පැවැත්වීම පිළිබඳ සනාථ කළ හැකි අත්දැකීම්;
- ජාතික ඇගයීම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුව පිළිබඳ හුරුපුරුදු බව;
- සමාජ-ආර්ථික පර්යේෂණ, පදනම් හා බලපෑම් අධ්‍යයනයන් සහ ව්‍යාපෘති ඇගයීම් පිළිබඳ ප්‍රවීණතාවය;
- MS Excel, SPSS, NVivo, හෝ QDA Miner වැනි පරිගණක වැඩසටහන් මගින් කටයුතු කිරීමේ ශක්තිමත් විශ්ලේෂණ කුසලතා සහ ප්‍රවීණතාවය;

  තිබිය යුතුය.

**තේරීම් නිර්ණායක**

පහත කරුණු මත පදනම්ව යෝජනා ඇගයීමට ලක් කෙරේ:

1. යෝජිත ක්‍රමවේදය: යෝජිත ඒකාබද්ධ ක්‍රම ප්‍රවේශයේ පැහැදිලි බව සහ යෝග්‍යතාවය (පවතින තොරතුරු සමාලෝචන, ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ සම්මුඛ සාකච්ඡා, ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා සහ ක්ෂේත්‍ර නිරීක්ෂණ).

2. කාර්ය සැලැස්ම: සති හතරක් ඇතුළත ඇගයීම සම්පූර්ණ කිරීම සඳහා උචිත අර්ථවත් සහ කළ හැකි වැඩ සැලැස්මක්

3. පූර්ව අත්දැකීම්: ජීව දත්ත පත්‍රිකාවක් සහ සමාන පැවරුම්වල සාරාංශයක් මගින් සනාථ කළ හැකි, ඇගයුම්කරුගේ මීට පෙර ප්‍රකාශයට පත්කර ඇති අත්දැකීම් සහ සුදුසුකම්.

4. පූර්ව යෝජනාව ඉදිරිපත් කිරීම: කෙටි ක්‍රමවේදයක්, මූලික වැඩ සැලැස්මක්, මිල යෝජනාවක් සහ අදාළ ඇගයීම් අත්දැකීම්වල සාරාංශයක් සමග ඉදිරිපත් කරන ලද පූර්ව යෝජනාවේ සම්පූර්ණත්වය සහ ගුණාත්මකභාවය.

**තොරතුරු ඉදිරිපත් කිරීම**

උනන්දුවක් දක්වන ඇගයුම්කරුවන්ගෙන් 2025.11.28 දින පෙ.ව 10.00 ට හෝ ඊට පෙර "ලේකම්, බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සෙත්සිරිපාය (පළමු අදියර), බත්තරමුල්ල" යන ලිපිනයෙහි පිහිටි සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ, අතිරේක ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන හා විදේශ) කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් බාහාලනයට අතින් ගෙනවිත් හෝ එදින පෙ.ව 10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**පූර්ව යෝජනාවට**

- කෙටි යෝජිත ක්‍රමවේදයක්;
- මූලික වැඩ සැලැස්මක්;
- මීට පෙර සිදු කරන ලද පැවරුම් ඇතුළුව අදාළ ඇගයීම් අත්දැකීම් පිළිබඳ සාරාංශයක්; සහ
- සම්පූර්ණ වෘත්තීය ගාස්තුව සහ වෙනත් ආශ්‍රිත පිරිවැය දැක්වෙන මිල යෝජනාවක්

ඇතුළත් විය යුතුය.

පූර්ව යෝජනා ලබා ගැනීම අවසන් වූ සැනින් අතිරේක ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන හා විදේශ) නිල කාර්යාලයේදී එම යෝජනා විවෘත කරනු ලබන අතර ඒ සඳහා ඔබට හෝ ඔබගේ නියෝජිතයෙකුට සහභාගි විය හැක. ප්‍රමාද වී ලැබෙන පූර්ව යෝජනා ප්‍රතික්ෂේප කරනු ලබන අතර තේරීපත්වන පූර්ව යෝජනාකරුට ඒ බව විද්‍යුත් තැපැල මගින් දැනුවත් කරනු ලැබේ. මේ සඳහා ඔබගේ අයදුම්පතෙහි, **ක්‍රියාත්මක, නිවැරදි විද්‍යුත් තැපැල් ලිපිනයක්** අනිවාර්යයෙන් සඳහන් කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

පූර්ව යෝජනා බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ **"2025 මාතර නාවිමන සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථාන ව්‍යාපෘතියේ මධ්‍ය කාලීන ඇගයීම සඳහා මිල ගණන්"** ලෙස අනිවාර්යයෙන් සඳහන් කරන ලෙසද දන්වමි.

සවිස්තරාත්මක තොරතුරු සහ සම්පූර්ණ යොමුගත කොන්දේසි (TOR) සඳහා කරුණාකර https://mbrc.gov.lk/ වෙබ් අඩවියට පිවිසෙන්න:

ලේකම්,
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
8 වන මහල, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල